**කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - 2017**

**-----------------------------------------------------------**

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අංක 68/11 සහ 1979 දෙසැම්බර් 26 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත නියමාවලියේ 20 වන වගන්තිය සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය, 108 සහ 111 වගන්ති සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර, මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය ප්‍රකාර, විස්තරාත්මක වාර්තාවක් 2018 ජූනි 11 දින නිකුත්කරන ලදි .

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වන වගන්තිය මගින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

---

**2.1 තත්ත්වාගණනය කළ මතය**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

---

**ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02**

---

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව වෙළඳ හා ලැබිය යුතු දැහි වැඩිවීම රු.303,933 ක් වුවත්, එය රු. 278,469 ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ගැලපීම් කර තිබුණි.

**2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රදාන ගිණුම් තැබීම් සඳහා ආයතනය විසින් හඳුනාගෙන හෙළිදරව් කර තිබුණු ප්‍රතිපත්තිය අනුව ප්‍රාග්ධන ප්‍රදාන උපයෝගී කරගෙන මිලදී ගත් වත්කම් වලට අදාළ වියදම් විලම්භිත ආදායමක් ලෙස හඳුනා ගන්නා බව සඳහන් කර තිබුණද වත්කම් මිලදීගත් මූලාශ්‍රය නොසලකා රු. 11,472,426 ක් විලම්භිත ආදායම් ලෙස හඳුනාගෙන තිබුණි.

(ආ) ආයතන පාඨමාලා ගාස්තු ආදායම ගිණුම්ගත කිරීමට අදාළව නිවැරදි ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණ අතර ඊට අදාළ අභ්‍යන්තර පාලන ක්‍රමයක් ස්ථාපිත කර නොතිබුණි.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සටහන් අංක 7 අනුව පරිගණක හා මෘදුකාංගවලට අදාළ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ක්ෂය වටිනාකම රු.3,232,713 ක්

වුවත්, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි එය රු.2,672,713 ක් ලෙස දැක්වීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය රු. 560,000 කින් වැඩි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු ප්‍රාග්ධන ප්‍රදාන වලට අමතරව ආයතනයේ අරමුදල් වැය කර මිලදී ගෙන තිබුණු එකතුව රු. 5,179,805 ක වත්කම් අදාළ වත්කම් ගිණුම් වලට හර කිරීම වෙනුවට ප්‍රාග්ධන ප්‍රදාන වෙන් කිරීමේ ගිණුම් 3 ක ඍණ ශේෂ ලෙස දක්වා තිබීම හේතුවෙන් එම ඍණ ශේෂ, වැය කළ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමේ ශේෂය සමඟ හිලව් කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| කලින් ලැබූ පාඨමාලා ගාස්තු ආදායම | 13,483,703 | යාවත්කාලීන කරන ලද නිවැරදි උපලේඛන |
| ලැබිය යුතු පාඨමාලා ගාස්තු ආදායම | 29,184,568 | |
| වර්ෂයට අදාළ පාඨමාලා ගාස්තු ආදායම | 64,569,315 | |
| දේශන ගාස්තු වියදම් සඳහා වෙන්කිරීම් | 13,163,275 | වෙන්කිරීම් වලට අදාල විස්තරාත්මක උපලේඛන |

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම්

2013 ජුනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 ඡේදය ප්‍රකාරව සියලුම අතිරික්ත මුදල්, මුදල් අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය මත ස්ථාවර තැන්පතු, භාණ්ඩාගාර බිල්පත් හා කෙටිකාලීන තැන්පතු තුළ ආයෝජනය කළ යුතු වුවත්, ඊට පටහැනිව අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ රු.60,000,000 ක මුදලක් රාජ්‍ය බැංකුවක ආයෝජනය කර තිබුණි.

## 2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

2017 මැයි 26 දින ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් 2007 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා කාලය තුළ ශිෂ්‍යයින් විසින් තැන්පත් කර ඇති රු.3,661,000 ක පුස්තකාල හා විද්‍යා තැන්පතු ආයතනයේ ආදායමට ගැනීමට අනුමැතිය දී තිබුණද, ඊට පටහැනිව 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලයට අදාලව රු.1,371,600 ක මුදලක් 2017 දෙසැම්බර් 31 දින ආදායමට ගෙන තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.89,663,796 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.43,321,912 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.46,341,884 ක වර්ධනයක්

නිරීක්ෂණය විය. පුනරාවර්තන රාජ්‍ය ප්‍රදාන රු.22,159,896 කින් හා අභ්‍යන්තර ඉපයීම් රු.23,206,992 කින් වැඩි වීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වාම අතිරික්තයක් ඇති වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැලපීමේදී 2013 වර්ෂයේ රු.75,057,038 ක් වූ ආයතනයේ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී 2017 වර්ෂයේදී රු.165,991,718 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

**ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය නීත්‍යානුකූල නොවන ලෙස පවත්වා ගෙන යනු ලබන ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය සඳහා 2004-2014 අධ්‍යයන වර්ෂවලට බඳවා ගත් ශිෂ්‍යයින්ගේ අසමත්වීමේ ප්‍රතිශතය සියයට 38 සිට සියයට 92 දක්වා විය. තවද 2014 වර්ෂය තුළ ලියාපදිංචි වූ 44 දෙනෙකුගෙන් කිසිදු ශිෂ්‍යයෙක් විභාගය සමත්වී නොතිබුණි.

(ආ) ජාත්‍යන්තර සහ දේශීය ශ්‍රේණිගත කිරීම්වලදී විදේශ ශිෂ්‍යයන් ලියාපදිංචි වීමේ සංඛ්‍යාව ප්‍රධාන නිර්ණායකයක් වශයෙන් සලකනු ලැබුවත්, සමාලෝචිත වර්ෂයේදී විදේශ ශිෂ්‍යයන් දෙදෙනෙකු පමණක් ලියාපදිංචි වී තිබුණි.

(ඇ) ආයතනය වෙබොමෙට්‍රික්ස් (Webometrics) අනුව විශ්වවිද්‍යාල ජාත්‍යන්තරව ශ්‍රේණිගත කිරීමේදී, 2016 වර්ෂයේ 16,389 වන ස්ථානය හා දේශීය වශයෙන් 24 වන ස්ථානය හිමි වී තිබූ අතර, 2017 වර්ෂයේ දී පිළිවෙලින් 15,356 වන ස්ථානය හා 23 වන ස්ථානය හිමි වී තිබුණි.

(ඈ) පසුගිය වර්ෂයට සාපේක්ෂව ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව ශිෂ්‍යයින් 85 දෙනෙකුගෙන් අඩු වී තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිගේ අංක UGC/IUA/2/PGS හා 2010 ජුනි 11 දිනැති ලිපිය මඟින් කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලියට අදාළ නොවන පාඨමාලා පැවැත්වීමේ නීත්‍යානුකූල අයිතියක් නොමැති බව අවස්ථා දෙකකදී විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් දන්වා තිබුණද අදාළ කොමිෂන් සභා තීරණයන්ට පටහැනිව ආයතනය 2011 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුළ මෙම පාඨමාලාව සඳහා ශිෂ්‍යයන් 233 ක් ලියාපදිංචි කර, එයින් ශිෂ්‍යයන් 21 ක් සඳහා ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය (MBA) පිරිනමා තිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි (MBA) පාඨමාලාව සඳහා ලියාපදිංචි වන ශිෂ්‍යයින් වෙත අවශ්‍ය පොත් කට්ටලයක් ලබා දීම සඳහා පාඨමාලා ගාස්තුවේ කොටසක් ලෙස රු. 100,000 ක මුදලක් ශිෂ්‍යයන්ගෙන් අයකරන අතර, එම මුදලින් ආයතනය බාහිර පාර්ශවයන්ගෙන් පොත් මිලදී ගෙන ශිෂ්‍යයන්ට ලබා දෙන නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විට විවිධ විෂයන් 10 කට අයත් රු.508,739 ක් වටිනා පොත් 77 ක් වසරකට අධික කාලයක් භාවිතා කර නොතිබුණි, එම පොත් ඵලදායීව යොදා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

(ආ) ආයතනය විසින් 2012 හා 2014 වර්ෂයන් තුළ අවශ්‍ය ප්‍රමාණයට වඩා පොත් මුද්‍රණය කිරීම නිසා 2018 ජනවාරි 20 දිනට ගබඩාවේ ඉතිරිව තිබුණු විවිධ ප්‍රකාශනවල වටිනාකම රු. 584.721 ක් විය.

## 4.4 අරමුදල් ඌන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පර්යේෂණ අරමුදල් 02 ක පැවති රු.526,022 ක් සමාලෝචිත වර්ෂය තුළ කිසිදු පර්යේෂණ කටයුත්තක් සඳහා යොදා ගෙන නොතිබුණි.

(ආ) 2017 වර්ෂයේදී ගොඩනැගිලි පුනරුත්ථාපනය සඳහා ලැබී තිබුණු රු.2,000,000 ක රජයේ ප්‍රාග්ධන ප්‍රදානවලින් 2017 දෙසැම්බර් 31 දිනට රු.1,600,000 ක් උපයෝජනය කර නොතිබුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.10 වගන්තිය ප්‍රකාරව, කොන්ත්‍රාත් හෝ අනියම් පදනම මත සේවයට යොදා ගැනීම සඳහා භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතු වුවද, ඊට පටහැනි ලෙස 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුළ කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 05 දෙනෙකු සේවයේ යොදවා රු. 3,926,585 ක් වැටුප් හා දීමනා වශයෙන් ගෙවා තිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

## 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර, සමාලෝචිත වර්ෂයට අදාළව කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 6.1 අභ්‍යන්තර විගණනය

2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ජ්/2009 (I) දරන විගණන හා කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව, සෑම අභ්‍යන්තර විගණන ඒකකයක්ම තම ආයතනය වෙනුවෙන් ඉලක්ක දිනයන්හිදී ඉදිරිපත් කළ යුතු මූලික වාර්තාව, කාර්තු වාර්තා හා වර්ෂයේ සාරාංශ වාර්තාව ඒ අනුව විගණන සහ කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

### 6.2 ප්‍රසම්පාදනයන් හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

#### 6.2.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ) වගන්තිය අනුව අවම වශයෙන් වසර 3 කට අදාළව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර, සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රසම්පාදන අත්පොතේ 4.2.1 වගන්තිය මඟින් හඳුන්වා දුන් ආකෘතිය අනුව පිළියෙල කර නොතිබුණි.

(ආ) ආයතනය 2017 වර්ෂය සඳහා පිළියෙල කර තිබූ, ප්‍රසම්පාදන සැලැස්ම වාර්ෂික අයවැය ලේඛනයට අනුකූලව පිළියෙල කර නොතිබුණි.

(ඇ) ප්‍රසම්පාදන සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය තුළදී රු. 23,981,000 ක් වටිනා භාණ්ඩ හා උපකරණ අත්පත් කර ගැනීමට සැලසුම් කර තිබූ නමුත්, රු. 3,371,463 ක් වටිනා භාණ්ඩ හා උපකරණ පමණක් සමාලෝචිත වර්ෂය තුළ අත්පත් කර ගෙන තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන සැලැස්ම පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඈ) අවශ්‍යතාවයන් හඳුනා නොගෙන 2017 වර්ෂයේදී රු.1,290,210 ක් වටිනා පුස්තකාල පොත් 110 ක් මිලදී ගෙන තිබුණද, එය ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

### 6.3 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත ආදායම් හා වියදම් තත්‍ය ආදායම් හා වියදම් සමග සැසඳීමේදී, විෂයන් 34 ක සියයට 21 සිට සියයට 1251 දක්වා පරාසයක් තුළ විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| **පද්ධති හා පාලන ක්ෂේත්‍ර** | | | **නිරීක්ෂණ** |
| --- | --- | --- | --- |
| (අ) | ගිණුම්කරණය | - | නිවැරදි ගිණුම්කරණයට අවශ්‍ය ප්‍රතිපත්ති හා අභ්‍යන්තර පාලන පද්ධතීන් සෑම ක්ෂේත්‍රයකට ක්‍රියාත්මක නොවීම. |
| (ආ) | මූල්‍ය කළමනාකරණය | - | අදාළ අරමුණු ඉටුකර ගත හැකි වන පරිදි ප්‍රදාන හා අරමුදල් උපයෝජනය නොකිරීම. |
| (ඇ) | මෙහෙයුම් පාලනය | - | මුදල් රෙගුලාසි සහ අදාළ චක්‍රලේඛ ප්‍රකාරව පොත්පත් හා ලේඛන පවත්වා නොගැනීම. |